# පළාත් පාලන ඡන්දය ඉල්ලා පැෆරල් ශ්‍රේෂ්ඨාධිකරණයට

**ඉන්දික හේවාවිතාරණ**

පළාත් පාලන ආයතන මැතිවරණය දිගින් දිගටම කල් දමන බැවින් මැතිවරණය කඩිනමින් පවත්වන ලෙස ඉල්ලා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම් සීමා නිර්ණය කමිටුව වගඋත්තරකරුවන් කරමින් අද (20දා) ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කරන බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

PAGE 4

# පළාත් පාලන ඡන්දය ඉල්ලා පැඟරල්...

මෙහිදී සීමා නිර්ණය කටයුතු අවසන් කර තිබෙන පළාත් පාලන ආයතන තුළ කඩිනමින් මැතිවරණය පවත්වන ලෙසට හා අනෙකුත් ආයතනවල සීමා නිර්ණ ගැටලු අවසන් කරන දිනය හා එම ආයතනවල මැතිවරණය පවත්වන දිනය ප්‍රකාශයට පත්කරන ලෙස මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිටින බවද එම සංවිධානයේ අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

දිගින් දිගටම මැතිවරණය කල් දැමීම තුළින් ඡන්දදායකයන්ට හා පළාත් පාලන ආයතන තුළින් සේවය ලබාගන්නා මහජනතාවට දැඩි දුෂ්කරතාවන්ට පත්ව සිටීමට සිදුව තිබෙන බවද හෙතෙම පවසා සිටියේය.

එහෙත් මැතිවරණය පැවැත්වීමට උනන්දුවක් අදාළ පාර්ශ්වවලට නොමැති බවත්, මේ නිසා ඡන්දදායකයන්ගේ අයිතිවාසිකම් රැකදීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කිරීමට තීරණය කළ බවද රෝහණ හෙට්ටිආරච්චි මහතා කියා සිටියේය.

පළාත් පාලන ආයතන 336 ම මේ වනවිට නිලධාරීන් පාලනයට නතු වී තිබෙන බවත්, පළාත් පාලන ආයතන පාලනය යම් යම් අවස්ථාවල නිලධාරී පාලනයට නතු වුවත් සමස්ත ලංකාවේම පළාත් පාලන ආයතන එකවර නිලධාරීන් යටතට පත්වීමක් මෑතකාලීනව සිදුවී නොමැති බවද ඒ මහතා සඳහන් කළේය.